Original

# පක්ෂ ව්‍යවස්ථාව

## 1. පක්ෂය

### I නාමය

ප්‍රජාතන්ත්‍රවාදය, ධරණීය, සංවර්ධනය, වංචාවෙන් දූෂණයෙන් තොර යහපාලනය ගුණාත්මක දේශපාලනය, එක්සත්බව, සංහිදියාව, තහවුරු කිරීමට ඇප කැපවෙන පක්ෂය.

අ. එක්සත් ජාතික නිදහස් පෙරමුණ
ආ. ஐக்கிய தேசிய சுதந்திர முன்னணி
ඇ. ද යුනයිටඩ් නැෂනල් ෆ්‍රීඩම් ෆ්‍රන්ට් ( United National Freedom Front )

ii වර්ණය කොළ, කහ, නිල්, රතු යන සිව් වර්ණය
iii ලාංඡනය කණ්ණාඩි කුට්ටම

## 2. ලිපිනය

118, බාන්ස් පෙදෙස, කොළඹ 07

## 3. අරමුණු

අ. ශ්‍රී ලංකාව තුල ප්‍රජාතන්ත්‍රවාදය සහතික කිරීම හා රටට ගැලපෙන පාලන තන්ත්‍රයක් බිහිකිරීමෙලා පෙනී සිටීම.

ආ. ශ්‍රී ලංකාවට ගැලපෙන්නාවූ ධරණීය සංවර්ධනයක් වෙනුවෙන් ඇපකැපවීම හා දූෂණය, වංචාව තුරන් කිරීමට ඇපකැපවීම

ඇ. දේශපාලන දැනුමින් හා වෘත්තීමය භාවයෙන් යුත් ගුණාත්මක දේශපාලඥයන් බිහිකිරීම හා සාමාන්‍ය ජනතාවගේ දේශපාලන දැනුම වර්ධනය කිරීමට ඇපකැපවීම.

ඇ. ශ්‍රී ලාංකිය ජාතියක් සඳහා ජාතික ආගමික සංහිදියාව ගොඩනැගීමට ඇප කැපවීම.

2

ඉ. දේශපාලනය මතය ප්‍රචාරය කිරීම, ඒ මතය හා සාමාන මත දරන හෝ අපගේ මතය පිළිගන්නා සංවිධාන, පුද්ගලයින්, කණ්ඩායම් හා පක්ෂ සමඟ එකාබද්ධව කටයුතු කිරීම.

ඊ දේශපාලනය තුළ උගත් වෘත්තිමය තරුණ හා කාන්තා නියෝජනය ඉහළ නැංවීම සදහා ඇප කැප වීම

උ. අ සිට ඊ දක්වා සමාජ ගත කිරීම.

## 4. සාමාජිකත්වය

I පක්ෂයේ ප්‍රතිපත්ති හා ව්‍යවස්ථාව පිළිගන්නා වයස අවුරුදු දාසයෙන් ඉක්ම වූ ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා සාමාජිකත්වය ලබාගත හැකිය.

Ii වාර්ෂිකව සාමාජික ගාස්තුව රු 100 කි. එම මුදල ගෙවා ලබාගන්නා සාමාජිකත්වය වසරකට පමණක් වලංගු වෙයි.

Iii අ. මහා සභාවේ ඡන්දය විමසන අවස්ථාවේ දී සිය අභිමතය පරිදි ඡන්දය
ප්‍රකාශ කිරීමේ අයිතිය එහි සාමාජිකයන්ට ඇත.

ආ සාමාජිකයින් පක්ෂයේ විනයට අනුකූල විය යුතු අතර, විනය බලය එක්සත් ජාතික නිදහස් පෙරමුණේ විධායක සභාව පත් කරනු ලබන විනය කමිටුව සතු එකී විනය කමිටුවක් විසින් ගනු ලබන තීරණ වලට අනුකූලව කටයුතු කිරීමට සාමාජිකයින් බැඳී සිටියි.

ඇ එක්සත් ජාතික නිදහස් පෙරමුණේ විනය කමිටු සාමාජිකයින් 3 දෙනෙකුගෙන් සමන්විත වන අතර විධායක සභාව විසින් යෝජනා කරනු ලබන 3 දෙනෙකු විධායක කමිටුවේ බහුතර කැමැත්තෙන් එහි සමාජිකයින් ලෙස පත්කරනු ලබයි.

ඈ එක්සත් ජාතික නිදහස් පෙරමුණේ සාමාජිකයින් විනය සම්බන්ධව සහ විනය කමිටුව පත් කරිම සහ එම කමිටුවට අදාල බලතල සම්බන්ධව සියලුම කාරනා ඇතුලත් යෝජනා සම්මතයක් විධායක සභාව විසින් සම්මත කරගනු ලැබිය යුතු අතර, එතැන් පටන් එකී යෝජනා සම්මතය එක්සත් ජාතික නිදහස් පෙරමුණේ විනය නීති සංග්‍රහය වන්නේය.

ඉ. මහා සභාවේ ඡන්දය විමසන අවසථාවේ දී සිය අභිමතය පරිදි ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය එහි සාමාජිකයින්ට ඇත.

IV කිසිදු සාමාජිකයකු තවත් සාමාජිකයකු ප්‍රසිද්ධියේ විවේචනය නොකල යුතු අතර කිසියම් චෝදනාවක් වේ නම් පළමුව ඔහු/ඇය සමඟ සාකච්ඡා කිරිමත් එමඟින්ද විසදුමක් නොලබන්නේ නම් විනය කමිටුව වෙත දැනුම් දීමක් කළ යුතුය. එහිදි විනය කමිටුව විසින් ඒ සම්බන්ධව දෙසතියක් තුල සුදුසු පරිදි කටයුතු කරන අතර එහි තීරණය සියලු පාර්ශවයන් පිළිගැනීමට බැදි සිටියි.

V පක්ෂයේ ප්‍රතිපත්ති කඩකරමින් සංවිධානයට බරපතල අගතියක් සිදුකරන බැවින් කිසියම් සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අත්හිටුවිය යුතු බවට සාමාජිකුගෙන්ම ලැබෙන්නා වූ පැමිණිල්ලක් මත විනය කමිටුව විසින් කරනු ලබන අපක්ෂපාති පරික්ෂණයකින් වැරදි කරුවකු වුවහොත් මිසක හෝ ඉල්ලා අස්වීමේ ලිපියක් ලබාදුනහොත් හෝ වාර්ෂිකව සාමාජිකත්වය අලුත්කර නොගතහොත් පමණක් සාමාජිකත්වය අහෝසිවන්නේය.

Vi විනය කමිටුව ගන්නා තීරණ විධායක සභාවට දැනුම් දියයුතු අතර විධායක සභාවේ අනුමැතිය මත ක්‍රියාත්මක කිරීම හෝ නොකිරීම කල යුතුය.

## 5. පක්ෂයේ ව්‍යුහය

### I මහා සභාව

අ. මහා සභාවක් ඇත. එහි 15 කට නොඅඩු 60 කට නොවැඩි සාමාජිකයින් ප්‍රමාණයක් සිටිය හැකිය.

ආ. මහා සභාවේ ඝනපුර්ණය 15 ක් විය යුතු අතර, ඝනපුර්ණය නොමැතව මහා සභාව පවත්වාගෙන යා නොහැකිය.

ඇ. මහා සභාවේ ප්‍රධානියා සභාපතිවරයාය. සභාපතිවරයා නොමැති අවස්ථාවල උපසභාපතිවරයා මහා සභාවේ ප්‍රධානියා වන්නේය. මහා සභාවට සාමාජිකයින් පත් කිරීම විධායක සභාව විසින් ප්‍රධාන ලේකම්වරයාගේ අත්සනින් යුතුව සිදු කරනු ලබන්නේය.

ඈ (1) පක්ෂයේ සමාජිකයෙකු මහා සභාව නියෝජනය නොකළ යුතු යැයි විධායක සභාව විසින් විශ්වාස කරන්නේ නම් ගරු සභාපතිවරයා විමසීමෙන් අනතුරුව එම අයගේ මහා සභාවේ නියෝජනය යම් කාලයකට හෝ සම්පූර්ණයෙන් අහිමි කිරීමට හැකි වන්නේය. නමුත් මෙමගින් එම පක්ෂ සාමාජිකයාගේ පක්ෂ සාමාජිකත්වය අහිමි වීමක් සිදු නොවේ.

ඉ මහා සභාව සෑම මාස 03 කට වරක්ම අවම වශයෙන් රැස්විය යුතුය.

ඊ මහා සභාවේ සනපූර්ණ නොමැති අවස්ථාවකදී හදිසි කාරණාවක් නොමැතිනම් පමණක් මිලඟ මහා සභා දිනය තෙක් කල් දැමිය හැකිය.

උ මහා සභාවේ සාමාජිකයෙකු ඉවත් කළ හැක්කේ අකාර්යක්ෂමතාවය, විනය විරෝධි කටයුතු කිරීම හෝ ඉල්ලා අස්වීමකදීය.

ඌ මහා සභාව කැඳවීම, මහා සභාවට සහභාගිවන්නේ තීරණය කිරීම, මහා සභාවේ කටයුතු තීරණය කිරීම විධායක සභාවට බලය ඇත.

## ii නිළධාරි මණ්ඩලය

අ. සභාපතිවරයෙක් වන්නේය. මහා සභාවේ සහ විධායක සභාවේ සභාපතිවරයා වන්නේය. මහා සභාවේ බහුතරයේ විශ්වාසය ඇතිතාක් දුරට සභාපතිවරයාට එම තනතුරේ කටයුතු කළ හැකිය. මහා සභාව සහ විධායක සභාව විටින් විට පවරනු ලබන බලතල සභාපති විසින් ක්‍රියාතමක කල යුතුය.

ආ. ප්‍රධාන ලේකම්වරයෙක් වන්නේය. විධායක සභාවේ බහුතර ඡන්දයෙන් ඔහු පත්කර ගනී. පළමු ප්‍රධාන ලේකම්වරයා පක්ෂය පිහිටුවීමෙන් පසු අවුරුදු 12 ක් සඳහා නිල බලයෙන් තම ධූරය උසුලන ලබන්නේය. සභාපති විමසා විධායක කාරක සභාවට සාමාජිකයින් පත්කර ගැනීම, පළාත් දිස්ත්‍රික් සහ ප්‍රාදේශිය සංවිධායකවරුන් පත් කිරීම පක්ෂයෙන් ලිපි ලේඛන භාරව කටයුතු කිරීම, පක්ෂයේ සියලු ලිපි ලේඛන සඳහා පක්ෂය නියෝජනය කරමින් අත්සන් තැබීමේ බලය ඇති නිළධාරියා ලෙස කටයුතු කිරීම, පක්ෂයේ කටයුතු විධිමත් කර ගැනීම සඳහා අලුතින් තනතුරු ඇතිකර ගත යුතු නම්, විධායක සභාව විමසා එහි අනුමැතිය මත තනතුරු ඇති කිරීම සහ සුදුසු අය පත් කිරීම, තවද මහා සභාව විසින් විටින් විට පවරන බලතල ලේකම්වරයා විසින් ක්‍රියාත්මක කල යුතුය.

ඇ. පක්ෂයට න්‍යායාචාර්යවරයකු වන්නේය. පක්ෂයේ ප්‍රතිපත්ති සම්පාදන කිරීමේ දීත්, පක්ෂයේ දේශපාලන උපායමාර්ග සකස් කිරිමේදීත්, අවශ්‍ය මඟපෙන්වීම සිදුකිරීම ඔහුගේ කාර්යභාරය වන්නේය. මහා සභාවේ වාර්ෂික නිලවරණයෙන් තේරීපත් වන අතර, මහා සභාවේ විශ්වාසය අතිතාක් කල් තනතුරු දැරිය හැකිය. මහා සභාව විසින් විටින්විට පවරනු ලබන කාර්යයන්ද ඉටුකිරීම නයාචාර්යවරයා කටයුතු කළ යුත්තේය.

ඈ. ජාතික සංවිධායකවරයෙක් වන්නේය. විධායක භාවේ බහුතර කැමැත්තෙන් පළාත් 9 හ අතිරේක සවිධායකවරුන් 9 දෙනෙක් වාර්ෂිකව තේරී පත් වන්නේය. ලේකම්වරයා හා සභාපතිවරයා දැනුවත්ව කටයුතු සංවිධානය කිරීම ප්‍රධාන ජාතික සංවිධායකට පැවරෙන්නේය. දිස්ත්‍රික් සංවිධාන, ප්‍රාදේශිය සංවිධාන ඇති කිරීම ද ප්‍රධාන ජාතික සංවිධායක වෙත පැවරෙන්නේය. විධායක සභාවේ බහුතරයේ විශ්වාසය ඇතිතාක් ප්‍රධාන ජාතික සංවිධායකවරයාට එම තනතුරේ කටයුතු කල හැකිය. විධායක සභාව විටින් විට පවරන බලතල ජාතික සංවිධායක විසින් ක්‍රියාත්මක කල යුතුය. අතිරේක පළාත් සංවිධායකවරුන් නව දෙනාගේ කටයුතු අධික්ෂණය කිරීම හා උපදෙස් දීම කළ යුතුය.

ඉ භාණ්ඩාගාරිකවරයෙක් වන්නේය. සංවිධානයේ අරමුදල් භාරව කටයුතු කිරීම, අරමුදල් තරකිරීම භාණ්ඩාගාරිකට පැවරෙන්නේය. මහා සභාවේ බහුතර ඡන්දයෙන් වාර්ෂිකව පවත්වන අතර මහා සභාවේ බහුතරයේ කැමැත්ත ඇතිනාක් එම තනතුරේ කටයුතු කල හැකිය.

ඊ ප්‍රචාරක ලේකම්වරයෙක් වන්නේය. පක්ෂයේ ප්‍රතිපත්ති, පක්ෂයේ පණිවිඩ ග්‍රාමීය මට්ටම දක්වා ප්‍රචාරය කිරීම, ඒ සඳහා අවශ්‍ය සංවිධාන කමිටු ප්‍රධාන ලේකම්වරයාගේ හෝ සභාපතිවරයාගේ අනුදැනුම මත ජාතික සංවිධායකවරයාගේ ද එකඟතාවයෙන් ගොඩනැගීමට අවකාශ ඇත.

උ උප සභාපතිවරු 5 දෙනෙක් වන්නේය. සභාපතිවරයාගේ කටයුතු වලට සහය වීමට කාන්තා නියෝජනය ඇතුලු 05 දෙනෙකු විධායක සභාවේ බහුතර ඡන්දයෙන් වාර්ෂිකව පත්වන අතර විධායක සභාවේ බහුතර කැමැත්ත ඇතිනාක් එම තනතුරේ කටයුතු කල හැකිය සභාපතිවරයා නොමැති අවස්ථාවල සභාපතිධුරයේ වැඩ ආවරණය කරනු ලැබිය යුතු අතර වරින්වර විධායක සභාව විසින් පවරන වගකීම් ඉටුකළ යුතුය.

ඌ උප ලේකම්වරු 5 දෙනෙක් වන්නේය. ලේකම්වරයාගේ කටයුතු වලට සහය වීමට මහ සභාවේ බහුතර ඡන්දයෙන් වාර්ෂිකව පත්වන අතර විධායක සභාවේ බහුතර කැමැත්ත ඇතිනාක් එම තනතුරේ කටයුතු කල හැකිය. ලේකම්වරයා නොමැති අවස්ථාවල ලේකම්ධුරයේ වැඩ ආවරණය කරනු ලැබිය යුතු අතර වරින්වර විධායක සභාව විසින් පවරන වගකීම් ඉටු කළ යුතුය.

එ උප භාණ්ඩාගාරිකවරයෙක් වන්නේය. භාණ්ඩාගාරිකවරයාගේ කටයුතු වලට සහය වීමට මධ්‍යම කාරක සභාවේ බහුතර ඡන්දයෙන් වාර්ෂිකව පත්වන අතර විධායක සභාවේ බහුතර කැමැත්ත ඇතිනාක් එම තනතුරේ කටයුතු කල හැකිය. භාණ්ඩාගාරිකවරයා නොමැති අවස්ථාවල භාණ්ඩාගාරිකවරයාගේ වැඩ ආවරණය කරනු ලැබිය යුතු අතර වරින්වර විධායක සභාව විසින් පවරන වගකීම් ඉටු කළ යුතුය.

ඒ 5.i අ.ට යටත්ව 5.ii ආ. පරිදි 5.ii ඔ සඳහා පත්කරන සාමාජිකයින් අතරින් පක්ෂයේ ප්‍රධාන ලේකම්ගේ කටයුතු පහසු කර ගැනීම සඳහා අංශභාර ලේකම්වරුන් ප්‍රධාන ලේකම් විසින් අතවශ්‍ය

ක්ෂේත්‍ර වෙනුවෙන් වාර්ෂිකව පත්කර ගන්නේය. එම ලේකම්වරුන් විසින් අදාළ ක්ෂේත්‍රය සම්බන්ධ වගකීම් ඉටුකළ යුත්තේය.

ඔ කාරක සභිකවන් වන්නේය. පක්ෂයේ කටයුතු සඳහා සහය වීමට විවිධ කේෂ්ත්‍රයන් වෙනුවෙන් 5.i අ.ට යටත්ව 5.ii ආ. පරිදි කාරක සභිකයින් වාර්ෂිකව පත් කිරීමට ලේකම්වරයාට හැකිය. විධායක සභාවේ බහුතරයේ කැමැත්ත ඇතිනාක් එම තනතුරේ කටයුතු කල හැකිය. විධායක සභාව විසින් වරින් වර පවරන වගකීම් ඉටුකළ යුතුය.

ඕ පක්ෂයට විගණකවරයෙක් වන්නේය. විධායක සභාවේ අනුමැතිය මත පක්ෂයේ ප්‍රධාන ලේකම් විසින් වරලත් ගණකාධිකාරිවරයා පත්කරකු ලබන අතර එම තනතුර වසර දෙකකට වලංගු වන්නේය. පක්ෂයේ මූල්‍ය කටයුතු විනිවිදභාවයකින් පවත්වාගෙන යාමට අවශ්‍ය නිර්දේශ මගපෙන්වීම මහා සභාවට ඉදිරිපත් කිරිම වාර්ෂිකව ගිණුම් විගණනය කිරිම ඔහු සතු කාර්ය වන්නේය.

## III අනෙකුත් සංවිධාන

අ කාන්තා බල මණ්ඩලයක් ඇත්තේය
ආ. තරුණ බල මණ්ඩලයක් ඇත්තේය
ඇ වෘත්තිය සමිති අංශයක් ඇත්තේය
ඈ දේශපලන අධ්‍යාපන අංශයක් ඇත්තේය
ඉ ප්‍රතිපත්ති හා ව්‍යවස්ථා අංශයක් ඇත්තේය
ඊ පර්යේෂණ හා සංවර්ධන අංශයක් ඇත්තේය
උ විදේශ / සම්බන්ධතා අංශයක් ඇත්තේය

## IV දිස්ත්‍රික් සංවිධාන

අ පක්ෂය තුළ දිස්ත්‍රික් සංවිධාන තිබිය යුත්තේය

ආ දිස්ත්‍රික් සංවිධානයේ ප්‍රධානියා දිස්ත්‍රික් සංවිධායක වන අතර විධායක සභාව විසින් එම පත් කිරීම හා ඉවත් කිරීම් සිදුකරනු ලබන්නේය

ඇ. ජාතික සංවිධායක විසින් එක් එක් ප්‍රාදේශීය බල ප්‍රදේශ සඳහා සංවිධායකයින් පත් කිරීමට ප්‍රධාන ලේකම්වරයා වෙත නිර්දේශ කරනු ලබන්නේය

ඈ. විධායක සභාව විසින් ගනු ලබන තීරණ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීම මෙහි කාර්ය භාරය වන්නේය.

## V ප්‍රාදේශීය සංවිධාන

අ පක්ෂය තුල ප්‍රාදේශීය සංවිධාන තිබිය යුත්තේ අවම වශයෙන් මැතිවරණ දිස්ත්‍රික්ක ඡන්ද කොට්ඨාශ දෙකක් සඳහා වත් ප්‍රාදේශීය සංවිධාන බිහිකළ යුත්තේ ය.

ආ ප්‍රාදේශීය සංවිධානයේ ප්‍රධානියා කොට්ඨාශ සංවිධායක වන අතර විධායක සභාව විසින් එම පත් කිරීම හා ඉවත් කිරීම සිදු කරනු ලබන්නේය.

ඇ. කොට්ඨාශ සංවිධායක විසින් එක් එක් ඡන්ද පොල බල ප්‍රෙද්ශ සඳහා සංවිධායකයින් පත් කිරීමට ප්‍රධාන ලේකම්වරයා වෙත නිර්දේශ කරනු ලබන්නේය.

ඈ. විධායක සභාව ජාතික සංවිධායකවරයා විසින් ගනු ලබන තීරණ ගම් නගර මට්ටම් තුල ක්‍රියාත්මක කිරීම මෙහි කාර්යභාරය වන්නේය.

## VI විධායක සභාව

අ විධායක සභාවක් වන්නේය. එහි සාමාජිකයින් ගණන 13 කි. විධායක සභාවේ නිල බලයෙන් සාමාජික්වය හිමි වන්නේ පක්ෂ සභාපති, පක්ෂ ලේකම්, පක්ෂ උප සභාපති, පක්ෂ උප ලේකම්, පක්ෂ භාණ්ඩාගාරික, පක්ෂ ජාතික සංවිධායක, පක්ෂ ප්‍රචාරක ලේකම්, විනය කමිටු සභාපති, ප්‍රධාන ලේකම්වරයා විසින්

සභාපතිවරයා විමසා පත්කරගනු ලබන ඉහත නිලතල නොදරන තවත් සාමාජිකයින් 5 දෙනෙක්. ඔවුන්ගේ ධුර කාලය වර්ෂයක් යන අතර ඔවුන් නැවත පත් කිරීමට සුදුසුකම් ලබන්නේය.

ආ විධායක සභාව පක්ෂයේ උත්තරීතර බල මණ්ඩලය වන්නේය.

ඇ විධායක සභාව වගකියනු ලබන්නේ පක්යේ සභාපතිවරයාට සහ ලේකම්වරයාට පමණක් වන්නේය.

ඇ පක්ෂ ලේකම්වරයා විසින් යම් අයෙකු අමතා ලිඛිතව යවනු ලබන ඉවත් කිරීමේ ලිපියක් මඟින් විධායක සභාවේ සාමාජිකත්වය ඉවත් කරනු ලැබිය හැකි වන්නේය. ( සභාපතිවරයා හැර )

ඉ පක්ෂ සාමාජිකයන්ගේ විනය සම්බන්ධ තීරණ හැර පක්ෂයේ සියලුම දේශපාලනික තීරණ ගැනීමේ තනි අයිතිය විධායක සභාවට හිමි වන්නේය. මහා සභාවේ යෝජනා විධායක සභාව විසින් තම තීරණ ගැනීමේ දී සලකා බැලිය හැකි වුවත් විධායක සභාව එවායින් බැදී නොසිටි.

## 6. අරමුදල්

අ පක්ෂයේ අරමුදල් විධායක සභාව භාරයේ පවති. විධායක සභාව එහි භාරකාරත්වය තීරණය කරනු ඇති අතර එය භාණ්ඩාගාරික වෙත පැවරේ

ආ පක්ෂයේ අරමුදල් සාමාජික ගාස්තු පරිත්‍යාගයක් හා අධාර හා විවිධ වැඩසටහන් මඟින් උපයාගන්නා අරමුදල් මත රදා පවති

ඇ පක්ෂයේ අරමුදල් තරකරගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට විධායක සභාවට හැකිය. බැංකු ගිණුම් ආරම්භ කිරීමේ හා ආයෝජනය කිරීමේ අභිමතය ද විධායක සභාවට ඇත.

ඈ පක්ෂයේ අරමුදල් තත්වය පිළිබඳ එක් එක් මහා සභා රැස්වීම් වලදී මහා සභාව දැනුවත් කිරීම භාණ්ඩාගාරිකගේ යුතුකමකි

ඉ වාර්ෂිකව පැවැත්වෙන මහා සභා රැස්වීමට භාණ්ඩාගාරික විසින් වාර්ෂික ගිණුම් වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

**ඊ තවද පක්ෂයට නිශ්චල හා චංචල දේපල අත්පත් කර ගැනීමට මහා සභාවට අවසර ඇති අතර එය පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයාගේ භාරයේ පවතින්නේය.**

**උ පක්ෂයේ ගිණුම් වාර්ෂිකව විගණනයකය යටත්වන අතර විගණකවරයා පත්කිරීමේ බලය මහලේකම් වෙත ඇත.**

## 7. ව්‍යවස්ථාවේ සංශෝධන

අ ව්‍යවස්ථාවේ කිසිම වගන්තියක් සංශෝධනය කිරීමට හෝ අලුතෙන් වගන්තියක් ඇතුලත් කිරීමට බලතල ඇත්තේ විධායක සභාවට පමණි.

ආ එක් වසරක් තුල ව්‍යවස්ථාව සම්බන්ධයෙන් සිදුකළ හැකි උපරිම සංශෝධ ප්‍රමාණය දෙකකට සීමා වෙයි.

## 8. පක්ෂය විසුරුවා හැරීම

අ පක්ෂයේ අරමුණු හා පරමාර්ථ ඉටු නොවන බවට තවදුරටත් පක්ෂය පැවතීමේ අවශ්‍යතාවයක් නැති බවට මහා සභාවේ මුළු සාමාජිකත්වයෙන් තුනෙන් දෙකකට වැඩි බහුතරය විසින් කරන යෝජනා සම්මතයක් සහභාගි වීමට සුදුකම් දක්වන සියලුම සාමාජිකයිනගේ තුනෙන් දෙකක බහුතර කැමැත්තක් ලද විශේෂ මහා සභා රැස්වීමකින් ද සම්මත වූ පසු විදුරා හැරිය හැකිය

ආ ඒ වන විට පක්ෂය සතුව පවත්නා වත්කම් බැරකම් සම්බන්ධව අවසාන තීරණය ගැනීම විධායක සභාව සතු අතර, එහිදි කිසියම් ගැටලුකාරී තත්වයක් ඇතිවුවහොත් ශ්‍රී ලංකාවේ වලංගු නීතියට අනුව අධිකරණය විසින් ලබාදෙන තීන්දුවට යටත් වේ.

## 9. අර්ථ දැක්වීම

මෙහි පාඨයන් අතර කිසියම් පරස්පරතාවයක් ඇත්නම් ඒ සම්බන්ධ අර්ථ දැක්වීමේ බලය ප්‍රධාන ලේකම්වරාය සතු අතර එය අවසානාත්මක වේ.

අප පක්ෂයේ ව්‍යවස්ථා වල අර්ථ නිරූපනය සම්බන්ධයෙන් ප්‍රශ්ණයක් මතුවුවහොත් ව්‍යවස්ථාවේ සිංහල පිටපත ප්‍රමුඛතාවය ගන්නා බව දැන ගත යුතුයි.